සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023**
**Second Term Test - Grade 11 - 2023**

# ක්‍රිස්තියානි ධර්මය - I

**කාලය පැය 01 යි**

**නම/ විභාග අංකය:**

- **1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති 1,2,3,4 පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරා ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ අංකයට ගැලපෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**
- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

---

01. දිවැසිවර යෙසායා ප්‍රකාශ කළ පරිදි එම්මානුවෙල් යන නාමයේ අර්ථය වන්නේ,
(1) දෙවියන් වහන්සේ ගලවන සේක ය. (2) දෙවියන් වහන්සේ ඔබ සමඟය ය.
(3) දෙවියන් වහන්සේ මුදවාලන සේක ය. (4) දෙවියන් වහන්සේ අප සමඟය ය.

02. මීකා දිවැසිවරයාගේ දිවැස්වැකියෙන් ප්‍රකාශ කරන්නේ,
(1) මානව වර්ගයාට විමුක්තිය උදාවීම පිළිබඳව ය.
(2) ඊශ්‍රායෙල්හි අධිපතීත්වය දැරුමට පැමිණෙන තැනැත් වහන්සේගේ උපත හා පෙළපත පිළිබඳව ය.
(3) යුක්තිය හා සාධාරණත්වය ඉටුකිරීම පිළිබඳව ය.
(4) පැමිණෙන්නට සිටින තැනැත්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳව ය.

03. මට පෙරටුව ගොස් මාගේ මාර්ගය පිළියෙල කරන්නා වූ මාගේ දූතයා මට පෙරටුව එවන්නෙමි ...................... මෙසේ ප්‍රකාශ කළේ,
(1) ස්නාවක ජොහාන්ගේ සේවය පිළිබඳ මලාකි දිවැසිවරයා ය.
(2) ස්නාවක ජොහාන්ගේ සේවය පිළිබඳ මීකා දිවැසිවරයා ය.
(3) ස්නාවක ජොහාන්ගේ සේවය පිළිබඳ ජේසුස් වහන්සේ ය.
(4) ස්නාවක ජොහාන්ගේ සේවය පිළිබඳ යෙසායා දිවැසිවරයා ය.

04. ජනතාවට මනස්ථාපනයේ බව්තීස්මය ලබාදෙනු ලැබුයේ,
(1) දෙවියන්වහන්සේ ය. (2) ජේසුස් වහන්සේ ය.
(3) ස්නාවක ජොහාන් ය. (4) ශුද්ධ වූ පේදුරුතුමා ය.

05. බෞතීස්මය, කැපකිරීම, ශුද්ධ වූ සහභාගිකම ආදී කිතුණු වත්පිළිවෙත් මගින්,
(1) පෞද්ගලික හා සාමූහික ආගමික වත්පිළිවෙත් ශක්තිමත් කරයි.
(2) චාරිත්‍රයන් ලෙස සිහිපත් කරයි.
(3) නීති හා සම්ප්‍රදායන් රැකීම අපේක්ෂා කරයි.
(4) ව්‍යවස්ථාව ආරක්ෂා කර සම්පූර්ණ කරයි.

06. පැරණි ගිවිසුමේ දෙවියන්වහන්සේ වැඩ සිටීම සංකේතවත් කරනු ලැබුයේ,
(1) ජලය මගින් ය. (2) ගින්න මගින් ය. (3) පරවියා මගින් ය. (4) වචනය මගින් ය.

07. ජේසුස් වහන්සේ ''දියබට ගොස් දැල් හෙලන්නයැයි'' පැවසූයේ,
(1) අන්ද්‍රෑට ය. (2) ජාකොබ්ට ය. (3) සීමොන්ට ය. (4) ජොහාන්ට ය.

08. ජුදා සමාජයේ ප්‍රතික්ෂේප වූ, කොන්කරනු ලැබූවන් වෙත ජේසුස් වහන්සේ අසීමිත ලෙස දයානුකම්පාව දැක් වූ බව ප්‍රකාශ කරනු ලබන්නේ,
(1) සාකෙවුස් හා මහලේ රෝගී කාන්තාව පිළිගැනීම තුළින් ය.
(2) දිය උදර රෝගියාට සුවය දීම හා ලාදුරු රෝගියාට සුවය දීම තුළින් ය.
(3) මතෙව් නම් ලෙවි කැඳවීම හා පව්කාර ස්ත්‍රිය පිළිගැනීම තුළින් ය.
(4) සාකෙවුස් පිළිගැනීම හා ලාදුරු රෝගියා සුව කිරීම තුළින් ය.

09. ජුදෙව් නමස්කාරයේ කේන්ද්‍රස්ථානය වූයේ,
(1) දේවස්ථානය ය. (2) ජෙරුසලම් දේව මාළිගාවය ය.
(3) සිනගෝගය ය. (4) ධර්මශාලාවය ය.

10. ජේසුස් වහන්සේගේ ඉගැන්වීම්වලට අනුව අසල්වැසියා වන්නේ,
(1) තමා ළඟ සිටින තැනැත්තා ය. (2) තම නවස අසලින්ම සිටින තැනැත්තා ය.
(3) තමාට ප්‍රේම කරන තැනැත්තා ය. (4) තමාට කරදරයකදී පිහිටවන තැනැත්තා ය.

11. ''ආබ්‍රහම් යන නාමයේ අර්ථය වන්නේ,''
(1) විශ්වාසයේ පියා යන්න ය. (2) ඇදහිල්ලේ පියා යන්න ය.
(3) ජාතින්ගේ පියා යන්න ය. (4) සමාදානයේ පියා යන්න ය.

12. මෙසියස් හෙවත් මෙසායා යනුවෙන් හඳුන්වන වචනය සඳහා හෙබ්‍රෙව් භාෂාවෙන් යොදාගනු ලබන්නේ,
(1) මෂියාහ් යන්නයි. (2) ක්‍රිස්ටොස් යන්නයි.
(3) ක්‍රිස්තුස් යන්නයි. (4) ජේහු යන්නයි.

13. ජුදා අධිපතීන් විසින් හිරගෙදර තිබුණු මඩ පිරුණු වළකට දමා කිසිම කෑමක් නොදී තැබුයේ,
(1) ජෝබ් ය. (2) ජෙරමියා ය. (3) සාවුල් ය. (4) පේදුරු ය.

14. දුක් විඳින සේවකත්වයට අපට දායක විය හැකි වනුයේ,
(1) විශ්වාසවන්තව ක්‍රියා කිරීම තුළින් ය.
(2) දුක්, පීඩා, කරදර දරාගැනීම තුළින් ය.
(3) විශ්වාසවන්තකම මත දුක දරාගැනීම තුළින් ය.
(4) මමත්වය නිසා පරාර්ථකාමී සේවකත්වයට ඇතුළුවීම තුළින් ය.

15. සදහටම පවතින ශ්‍රේෂ්ඨතම ධර්මතාවය වන්නේ,
(1) ප්‍රේමයයි. (2) කමාවීමයි. (3) ආදරයයි. (4) කරුණාවයි.

16. තම විශ්වාසයන් අතර විරසකයන් පැවතිය ද ජේසුස් වහන්සේ තමන්ට අභියෝගයක් වීම නිසා එක් වූ ජන කණ්ඩායම් දෙක වන්නේ,
(1) පරිසිවරුන් හා සමාරිතයන් ය. (2) පරිසිවරුන් හා සද්දුසිවරුන් ය.
(3) සද්දුසිවරුන් හා සමාරිතයන් ය. (4) සමාරිතයන් හා විනයධරයන් ය.

17. දෙවියන් වහන්සේගේ ධර්මිෂ්ඨකම නොතකා ක්‍රියා කරන ජුදෙව්වන් අවධි කිරීමට ජේසුස් වහන්සේ සිදුකළ සංකේතාත්මක ක්‍රියාව වන්නේ,
(1) දේව මාළිගාව පවිත්‍ර කිරීම ය. (2) පාළුකරයේ යාච්ඤා කිරීම ය.
(3) ශ්‍රාවකයන්ගේ පාද සේදීම ය. (4) ශුද්ධ වූ සහභාගිකම ලබාදීම ය.

18. ''පරීක්ෂාවට නොවැටෙන පණිස නැගිට යාච්ඤා කරන්න.'' ජේසුස් වහන්සේ ශ්‍රාවකයන්ගෙන් මෙම ඉල්ලීම කළේ,
(1) ගලීල මුහුදු වෙරලේ දී ය. (2) නාසරත්හි ධර්මශාලාවේ දී ය.
(3) ඔලීව කන්දේ දී ය. (4) ජෙරුසලම් දේව මාළිගාවේ දී ය.

19. මරණීය දඬුවම දීමට තරම් කිසිඳු වරදක් ජේසුස් වහන්සේ ළඟ නැති බව දුටුවේ,
(1) හෙරෝද් රජු සහ උත්තම පූජකයා ය.
(2) උත්තම පූජකයා සහ පොන්තියුස් පිලාත් ය.
(3) හෙරෝද් රජු සහ රෝම ශතාධිපතියා ය.
(4) පොන්තියුස් පිලාත් සහ හෙරෝද් රජතුමා ය.

20. ජේසුස් වහන්සේගේ කුරුසි පූජාවත් සමඟ දේව මාළිගාවේ තිරය දෙකඩ වීමෙන් සංකේතවත් කරන්නේ,
(1) සාමාන්‍ය ජනතාවට දෙවි සමිඳුන් වෙත ළඟාවීමට තිබූ බාධකය ඉවත් වීමයි.
(2) අන්‍ය ජාතීන්ට දේව මාළිගාවට පැමිණීමට තිබූ බාධකය ඉවත් වීමයි.
(3) දේව මාළිගාව සියලු දෙනාට විවෘත බව අනාවරණය වීමයි.
(4) පූජකයින්ගේ රහස් ජනතාවට එළිදරව් කිරීමයි.

21. අප බලාපොරොත්තු නොවන මොහොතක දේව රාජ්‍යයේ මෙහෙවර සඳහා කැඳවීම ලැබෙන බවට මඟපෙන්වීම ලබාදෙන්නේ,
    (1) පේදුරු ගෝලකමට කැඳවනු ලබන අවස්ථාවයි.
    (2) ජේසුස් වහන්සේ බෞතීස්ම කරනු ලබන අවස්ථාවයි.
    (3) ජේසුස් වහන්සේගේ කුරුසිය උසුලාගෙන යාමට සිරේනියේ සීමොන් කැඳවූ අවස්ථාවයි.
    (4) පාවුල් සහ බර්ණබස් සේවය සඳහා කැඳවූ අවස්ථාවයි.

22. ජේසුස් වහන්සේගේ ශ්‍රාවක පිරිසට නව බලාපොරොත්තුවක් ගෙන දෙන ශුභාරංචිය වූයේ උන්වහන්සේගේ,
    (1) උත්පත්තියයි.  (2) පුනරුජ්ජීවනයයි.
    (3) කුරුසිපත් වීමයි.  (4) ස්වර්ගාරෝහණය යි.

23. ''ඔබ කැළඹී සිටින්නේ මන්ද? ඔබගේ සිත්වල සැක උපදින්නේ මන්ද? ජේසුස් වහන්සේ මෙසේ වදාළේ,
    (1) විනිශ්චය සඳහා උත්තම පූජකයා ඉදිරිපිට සිටිය දී ය.
    (2) විනිශ්චය සඳහා හෙරෝද් රජු ඉදිරිපිට සිටිය දී ය.
    (3) පුනරුජ්ජීවනයෙන් පසු එම්මාවුස් ගමට ගිය ශ්‍රාවකයන් ඉදිරිපිට දී ය.
    (4) පුනරුජ්ජීවනයෙන් පසු ශ්‍රාවකයින් සියලුදෙනා ඉදිරිපිට දී ය.

24. කිතුණු අපට බෞතීස්මයේ දී දායාද වන දේව වරප්‍රසාදය වන්නේ,
    (1) දේව රාජ්‍ය උරුම වීමයි.  (2) ශුද්ධාත්ම අනුහසට විවෘත වීමයි.
    (3) කිතුණුකම ස්ථිර වීමයි.  (4) දේවදරුකම උරුම වීමයි.

25. කිතුණු ජීවිතයකට පරීක්ෂාවන් පැමිණෙන්නේ,
    (1) ළමාවියේ දී ය.  (2) තරුණවියේ දී ය.
    (3) වැඩිහිටි වියේ දී ය.  (4) ඕනෑම අවස්ථාවක දී ය.

26. යුක්තිය හා ධර්මිෂ්ඨකම රජයන තැන සාමය රජයන බව පැවසූ දිවැසිවරයා නම්,
    (1) මීකා ය.  (2) මලාකි ය.  (3) යෙසායා ය.  (4) ජෙරමියා ය.

27. තමන්ට දරුණු වෙඩි ප්‍රහාරයක් එල්ල කළ වෙඩික්කරුට කමාව ලබාදුන් විශිෂ්ඨ තැනැත්තා නම්,
    (1) දෙවන ජුවාම් පාවුල් පාප් වහන්සේ ය.  (2) පීටර් ජෙරාඩ් ද සිල්වා දේවගැතිතුමා ය.
    (3) තිස්ස බාලසූරිය පියතුමා ය.  (4) චන්ද්‍රා ප්‍රනාන්දු පියතුමා ය.

28. සැබෑ කිතුණුවන් ලෙස ජීවත් වීම දෙවියන් වහන්සේගේ කැමැත්ත බව ප්‍රකාශ කිරීමට ජේසුස් වහන්සේ වදාළ උපමා කථාව නම්,
    (1) සැබෑ මිදිවැල ය.  (2) යහපත් සමාරිතයා ය.
    (3) කමා නොවූ දාසයා ය.  (4) පරිසියා සහ අයකැමියා ය.

29. දෙවියන් වහන්සේ ඇතිකළ බලාපොරොත්තුව තුළ රැඳෙමින් තම පෞද්ගලික බලාපොරොත්තු ඉවත දමා ක්‍රියා කළ දෙදෙනෙකු වන්නේ,
    (1) මෝසෙස් සහ ආදම් ය.  (2) ආබ්‍රහම් සහ මෝසෙස් ය.
    (3) ආදම් සහ ජාකොබ් ය.  (4) කායින් සහ ජාකොබ් ය.

30. මුල් කිතුණු සභාවේ නමස්කාරික ජීවිතය තුළ දක්නට නොලැබුන ලක්ෂණයක් වන්නේ,
    (1) ගෙයින් ගෙට ගොස් රොටි කැඩීම ය.  (2) සහභාගිකම පැවැත්වීම ය.
    (3) විජාතීන්වෙත ශුභාරංචිය ගෙනයාම ය.  (4) යාඥාවේ නිරතව කල්ගත කිරීම ය.

31. විජාතීන්ගේ අපෝස්තුළුවරයා ලෙස හඳුන්වනු ලැබුයේ,
    (1) ජේසුතුමා ය.  (2) පේදුරුතුමා ය.  (3) ජොහාන්තුමා ය.  (4) පාවුල්තුමා ය.

32. ''මේ මාගේ පුත්‍රයාණෝ ය. මා තෝරාගත් තැනැත්තේ ය. මොහුට සවන් දෙන්න.''
ඉහත ප්‍රකාශය හා සම්බන්ධ අවස්ථාවේ වැදගත්කම වන්නේ,
(1) දේව හඬ ප්‍රකාශ වීම ය. (2) ශුද්ධාත්ම අනුහස එළිදරව් වීම ය.
(3) ශුද්ධ වූ ත්‍රිත්වය පහළ වීම ය. (4) මෝසෙස් හා එළියා දර්ශනය වීම ය.

33. දේව රාජ්‍යය ඉතා සුළුවෙන් ආරම්භ වී සීඝ්‍රයෙන් වර්ධනය වන බව ප්‍රකාශ කරන උපමාව වන්නේ,
(1) පරිසියා සහ අයකැමියා ය. (2) යහපත් සමාරිතයා ය.
(3) කමා නොවූ දාසයා ය. (4) අබ ඇටය පිළිබඳ උපමාව ය.

34. ජේසුස් වහන්සේගේ ඇගයීමට ලක් වූ විජාතික ශතාධිපතියා තුළ උන්වහන්සේ දුටු සුවිශේෂී ගුණාංගය වූයේ,
(1) ඇදහිල්ලයි. (2) නිහතමානීකම ය.
(3) කරුණාවන්තකම ය. (4) යටහත්පහත්කම ය.

35. දෙවියන් වහන්සේගේ අසීමිත ප්‍රේමය පිළිබඳව ඉගැන්වීමට ජේසුස් වහන්සේ වදාළ උපමා කතාව වන්නේ,
(1) මිදිවත්ත සහ ගොවීන් පිළිබඳ උපමාව ය.
(2) අකීකරු පුත්‍රයා පිළිබඳ උපමාව ය.
(3) කමා නොවූ දාසයා පිළිබඳ උපමාව ය.
(4) මහා මංගල භෝජනය පිළිබඳ උපමාව ය.

36. A කුඩා දරුවකු අගය කිරීම.
B පන්දහසකට කන්න දීම.
C ශ්‍රාවකයින්ගේ පාද සේදීම.
ජේසුස් වහන්සේ සේවක නායකත්වය ආදර්ශයෙන් දැක් වූ අවස්ථා වන්නේ,
(1) A හා B ය. (2) B හා C ය. (3) A හා C ය. (4) A, B හා C ය.

37. පහත දක්වා ඇති අවස්ථා සැලකිල්ලට ගන්න.
A සාවුල් සතුට පලකරන ලදී.
B හදිසියේ අහසින් ආලෝකයක් ඔහු අවට බැබළිනි.
C උත්තම පූජකයාගෙන් බලපත්‍රයක් ලබාගන්නා ලදී.
D නැගිට නුවරට ඇතුළුවන්න. ඔබ කළයුතු දේ ඔබට කියනු ලබන්නේ ය.
ඉහත ඒවා අතුරින් සාවුල්ගේ හැරීමට අදාළ වන අවස්ථා වන්නේ,
(1) B හා D ය. (2) A හා B ය. (3) B හා C ය. (4) A හා C ය.

38. විජාතීන්ට චර්මඡේදනය අවශ්‍ය නොවන බව තීරණය කරනු ලැබුයේ,
(1) එපීස මන්ත්‍රණ සභාවේ දී ය. (2) නයිසිය මන්ත්‍රණ සභාවේ දී ය.
(3) ජෙරුසලම් මන්ත්‍රණ සභාවේ දී ය. (4) කොන්ස්තන්තීනු මන්ත්‍රණ සභාවේ දී ය.

39. දෙවන ධර්මදූත ගමනේ දී පාවුල්තුමා සමග එක් වූ අයවලුන් වූයේ,
(1) සීලස්, ලූක්, ජොහාන් යන අය ය. (2) ලූක්, ජොහන්, බර්ණබස් යන අය ය.
(3) තිමෝතියස්, ජොහන්, ලූක් යන අය ය. (4) සීලස්, තිමෝතියස්, ලූක් යන අය ය.

40. ශ්‍රී ලංකාවේ දැනට පවතින අර්බුදකාරී තත්ත්වය හමුවේ ජීවත්වන කිතුණු අපගේ යුතුකම වන්නේ,
(1) අරගල කිරීමයි. (2) ඉවසීමෙන් ක්‍රියා කිරීමයි.
(3) සහන ඉල්ලීමයි. (4) කෙසේ හෝ මුදල් ඉපයීමයි.

(ලකුණු 1 x 40 = 40)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 11 - 2023

## ක්‍රිස්තියානි ධර්මය - II

කාලය පැය 02 යි

නම/ විභාග අංකය:

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

---

01. පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(1) (අ) ''සනදුරු දේශයේ'' විසුවන් ලෙස හඳුන්වන්නේ කවුරුන් ද?

(ආ) ඔවුන්හට ආලෝකයක් වූයේ කවුරුන් ද?

(2) ස්නාවක ජොහාන්ගේ සේවය පිළිබඳ ප්‍රකාශ කළ දිවැසිවරු දෙදෙනා කවුරුන් ද?

(3) නාසරෙත් ප්‍රකාශයේ සඳහන් ජේසුස් වහන්සේගේ සේවාවන් දෙකක් ලියා දක්වන්න.

(4) ජේසුස් වහන්සේ ''ආබ්‍රහම්ගේ පුත්‍රයා'' සහ ''ආබ්‍රහම්ගේ දියණිය'' ලෙස හැඳින්වූයේ කවුරුන් ද?

(5) ජේසුස් වහන්සේගේ කාලයේ පලස්තීන ජනතාවට ගෙවීමට සිදු වූ බදු වර්ග දෙක නම් කර ඒ සඳහා භාවිත කළ මුදල් වර්ග මොනවාදැයි ලියා දක්වන්න.

(6) යුතුකම් හා වගකීම් ඉටු කිරීමේ දී දස පනත තුළින් විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කරන පාර්ශව දෙක නම් කරන්න.

(7) සභා එකමුතුව සඳහා ක්‍රියා කරන සංවිධාන දෙකක් නම් කරන්න.

(8) (අ) ජේසුස් වහන්සේගේ රූප විපර්යාස අවස්ථාවේ දී එහි සිටි ශ්‍රාවකයන් නම් කරන්න.

(ආ) ඔවුන් දුටු දර්ශනය කුමක්දැයි ලියා දක්වන්න.

(9) සුදර්ශන දොරටුව අසල සිටි උපන්දාපටන් කොර මිනිසාට සුවය ලබාදෙමින් පේදුරු හා ජොහාන් කළ ප්‍රකාශය කුමක් ද?

(10) ජේසුස් වහන්සේ සේවක නායකත්වය ආදර්ශයෙන් දැක් වූ අවස්ථා දෙකක් ලියා දක්වන්න.

(ල. 2 x 10 = 20)

02. (1) (අ) ඊශ්‍රායෙල්වරු තම එඬේරාණන් ලෙස සැලකුවේ කවුරුන් ද?

(ආ) පැරණි ගිවිසුමේ සඳහන් එඬේර වෘත්තියේ යෙදුණු දෙදෙනෙක් නම් කරන්න.

(2) එඬේර චරිත ගුණාංග තුනක් නම්කර ජේසුස් වහන්සේගේ ජීවිතය තුළින් එම ගුණාංග ආදර්ශනය වූ අවස්ථා උදාහරණ මගින් ලියා දක්වන්න.

(3) වර්තමාන සමාජයේ එඬේරුන් ලෙස අපට ක්‍රියා කළ හැකි ආකාර පහක් කෙටියෙන් විස්තර කරන්න.

(ල. 2 + 3 + 5 = 10)

03. (1) ජේසුස් වහන්සේගේ කාලයේ පලස්තීන ජනතාව රෝම පාලනයෙන් පීඩා විඳි බවට සාක්ෂි දෙකක් ඉදිරිපත් කරන්න.

(2) පරිසිවරු තමන්ගේ ධාර්මික බව ගැන අතිශයින් උඩඟුව කළා වූ ක්‍රියාවන් තුනක් පෙන්වා දෙන්න.

(3) පරිසිවරුන්ගේ හා විනයධරයන්ගේ ක්‍රියා පිළිවෙත විවේචනය කරමින් ජේසුස් වහන්සේ ඉස්මතු කළ යහපත් ගුණාංග අපගේ ජීවිතවලට වැදගත් වන්නේ කෙසේදැයි වාක්‍ය පහක් ලියන්න.

(ල. 2 + 3 + 5 = 10)

04. (1) (අ) ප්‍රාතිහාර්යයන් හෙවත් හාස්කම් හැඳින්වීම සඳහා ග්‍රීක බසින් භාවිත කළ වචනයක් ලියන්න.
(ආ) එම වචනයෙහි අර්ථය කුමක් ද?
(2) දේව රාජ්‍යයේ ලකුණු හෙවත් ප්‍රාතිහාර්යයන් තුනක් සඳහන් කර ඒ සඳහා උදාහරණය බැගින් ලියා දක්වන්න.
(3) ජේසුස් වහන්සේ කළ ප්‍රාතිහාර්යයන් අපගේ ජීවිත තුළින් අත් දකින්නට අප තුළ වර්ධනය කර ගත යුතු ගුණාංග පහක් කෙටියෙන් විස්තර කරන්න.

(ල. 2 + 3 + 5 = 10)

05. (1) යාච්ඤාව යනු කුමක්දැයි හඳුන්වන්න.
(2) ජේසුස් වහන්සේ යාච්ඤාවෙන් කටයුතු කළ අවස්ථා තුනක් සඳහා උදාහරණ තුනක් ලියන්න.
(3) යාච්ඤාව තුළින් ඔබගේ ජීවිත ආලෝකමත් වූ අවස්ථාවන් පහක් උදාහරණ සහිත ව ඉදිරිපත් කරන්න.

(ල. 2 + 3 + 5 = 10)

06. (1) පළමු ධර්මදූත ගමන සඳහා සහභාගි වූ අය නම් කරන්න.
(2) පළමු ධර්මදූත ගමන සඳහා ඔවුන් ශක්තිමත් කර යැවූ අන්තියෝකියේ සභාව පිළිබඳ කරුණු තුනක් ලියන්න.
(3) පළමු ධර්මදූත ගමනේ දී ලුස්ත්‍රාවේ දී සිදු වූ අභියෝගාත්ම සිදුවීම තුළින් කිතුණු දරුවකු වන ඔබගේ ජීවිතයට ගත හැකි ආදර්ශ පහක් කෙටියෙන් විස්තර කරන්න.

(ල. 2 + 3 + 5 = 10)

07. තෝරාගත් මාතෘකා 02 ක් යටතේ කෙටි සටහන් ලියන්න. ඒ සඳහා දී ඇති උපදෙස් වාක්‍යය භාවිත කරන්න.

(අ) පරීක්ෂාවන් ජය ගනිමු.
* පරීක්ෂාව යනු කුමක්දැයි හැඳින්වීම.
* ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂාවන්
* ජේසුස් වහන්සේ පරීක්ෂාවන් හමුවේ ක්‍රියා කළ ආකාරය
* ඔබගේ ජීවිතයට පැමිණෙන්නා වූ පරීක්ෂාවන්
* පරීක්ෂාවන් හමුවේ ඔබ ක්‍රියා කරන ආකාරය

(ආ) පෙරමඟ දූත සේවය
* පෙරමඟ දූතයා ලෙස හඳුන්වන්නේ කවුරුන් ද?
* පෙරමඟ දූත සේවයට සූදානම් වූයේ කෙසේ ද?
* පෙරමඟ දූත සේවය කළේ කා වෙනුවෙන් ද?
* එම සේවය සිදුකළ ආකාරය
* අද අපට එම සේවය වැදගත් වන අන්දම

(ඇ) මුල් කිතුණු සභාව
* ආරම්භය සිදු වූ ආකාරය
* එදින සිදු වූ විශේෂ සිදුවීම
* ඔවුන් ක්‍රියා කළ ආකාරය
* කිතුණු සභාවේ ලක්ෂණ
* එමගින් අප ලබන ආදර්ශයන්

(ඈ) ගරු චන්ද්‍රා ප්‍රනාන්දු පියතුමා
* එතුමා හඳුන්වන්න.
* එතුමාගේ ජීවිත පසුබිම
* එතුමාගේ දැක්ම
* එතුමාගේ සේවය
* එතුමාගේ සේවය තුළින් කිතුණු අපගේ ජීවිතවලට ගත හැකි ආදර්ශ

(ල. 5 + 5 = 10)

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (4) | 02. (2) | 03. (1) | 04. (3) | 05. (1) | 06. (2) | 07. (3) | 08. (4) | 09. (2) | 10. (4) |
| 11. (3) | 12. (1) | 13. (2) | 14. (4) | 15. (1) | 16. (2) | 17. (1) | 18. (3) | 19. (4) | 20. (3) |
| 21. (3) | 22. (2) | 23. (4) | 24. (2) | 25. (4) | 26. (3) | 27. (1) | 28. (1) | 29. (2) | 30. (3) |
| 31. (4) | 32. (3) | 33. (4) | 34. (1) | 35. (2) | 36. (3) | 37. (1) | 38. (3) | 39. (4) | 40. (2) |

(ලකුණු 40)

## II පත්‍රය

01. (1) (අ) සනදුරු දේශයේ විසූවන් - පාපයට යොමු වූ ජනතාව
(ආ) ආලෝකය - ජේසුස් වහන්සේ

(2) යෙසායා සහ මලාකි

(3) දිළින්දන්ට සුභාරංචිය දේශනා කිරීම. / වහලුන්ට මිදීම ලැබෙන බව දැන්වීම. / අන්ධයන්ට පෙනීම ලැබෙන බව දැන්වීම. / පීඩිත වූවන් මුදවාලීම.

(4) ආබ්‍රහම්ගේ පුත්‍රයා - සකෙවුස් / ආබ්‍රහම්ගේ දියණිය - කුදු ස්ත්‍රිය

(5) රෝම අධිරාජ්‍යයාට ගෙවූ බද්ධ - රිදී කාසි, දිනාර්
දේවස්ථානයට ගෙවූ බද්ධ - තඹ කාසි

(6) දෙවියන් වහන්සේ සහ මිනිසා අතර සබඳතාවය මිනිසා සහ මිනිසා අතර සබඳතාවය

(7) ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය (N. C. C. D. L)
ලංකා දේව ධර්ම ශාස්ත්‍රාලය (T. C. L)
ශ්‍රී ලංකා බයිබල් සමාගම (C. B. S)
තරුණ ක්‍රිස්තියානි සංගමය (Y. M. C. A)
ක්‍රිස්තියානි කම්කරු සහෝදරත්වය (C. W. F)

(8) (අ) පේදුරු, ජාකොබ්, ජොහන්
(ආ) ජේසුස් වහන්සේ දෙපස මෝසෙස් සහ එළියා තේජශ්‍රීයෙන් වැඩ සිටීම.

(9) ''රන්වත් රිදීවත් මට නැත. මට ඇති දේ ඔබට දෙමි.'' නාසරිය ජේසුස් වහන්සේගේ නාමයෙන් ඇවිදින්න.

(10) කුඩා දරුවකු අගය කිරීම. / ශ්‍රාවකයන්ගේ පාද සේදීම. / සේවය අවශ්‍ය අය වෙතට ගොස් සේවය කිරීම. / බොහෝ දෙනාගේ මිදීම උදෙසා තම ජීවිතය පූජා කිරීම. (ල. 2 x 10 = 20)

02. (1) (අ) දෙවියන් වහන්සේ
(ආ) ජාකොබ්, ආබෙල්, දාවිත්

(2) පෝෂණය කිරීම - පන්දසකට කෑම ලබාදීම.
මඟපෙන්වීම - හාරදහසකට කෑම ලබාදීම.
රැකබලා ගැනීම - සකෙවුස් මිදීම.
සොයා ගෙනඒම - ලෙවි ගැලවීම, පව්කාර ස්ත්‍රිය මිදීම, සමාරිය ස්ත්‍රිය මිදීම, සුව කිරීම
(ලියා ඇති උදාහරණ සඳහා ලකුණු ලබාදෙන්න.)

(3) * එඬේර ප්‍රේමය දැක්වීම, ජනතාව පෝෂණය කිරීම.
* ජනතාව වෙනුවෙන් ජීවිතය කැප කිරීම, ජනතාවට සේවය කිරීම. (ල. 2 + 3 + 5 = 10)
(ආදී ලෙස ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න.)

03. (1) අයකැමියන් ජුදෙව්වන් විසින් දේශද්‍රෝහියන් ලෙස පිළිකුල් කිරීම. / රෝම පාලනය යටතේ හේවායකුගේ බඩු මිටිය සැතපුමක් දුර ගෙනයාමට බල කිරීම.

(2) තම වස්ත්‍රවල පවා ශුද්ධ ලියවිලි පාඨ ලියා තිබීම / දන්දීමේදී හොරණෑ බිඳ නැගීම / මංසන්දිවල ප්‍රසිද්ධියේ යාච්ඤා කිරීම

(3) * දේව වචනයේ හරය අවබෝධ කර ගැනීම.
* ස්තුතිවන්ත භාවය ඇතිකර ගැනීම.
* උන්වහන්සේගේ කැමැත්තට ප්‍රතිචාර දැක්වීම.
* ජේසුස් වහන්සේගේ අධිකාරී බලය පිළිබඳ විශ්වාසය ආදී පිළිතුරු (ල. 2 + 3 + 5 = 10)

## පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස

04. (1) අ)ඩුනෝමිස්, සේමෙයොන්
ආ) අර්ථය - දේව බල ලකුණු යන්න යි.
(2) සුවකිරීම් - ශාරීරික රෝග, අන්ධ, අංශභාග, ලාදුරු වැනි.
අශුද්ධ ආත්ම - ගෙරසේනයේ රටේ සිදුවීම.
ස්වභාවධර්මය අභිබවා කළ ක්‍රියා - කුණාටුව සංසිඳවීම.
මරණයෙන් උත්තාන කිරීම - ජායිරස්ගේ දියණිය / නායින්නුවර වැන්දඹුවගේ පුතා නැගිටුවීම.
(3) දේවබලය කෙරෙහි ඇදහිල්ල - අචල විශ්වාසය.
ස්තුතිවන්තභාවය ඇති කර ගැනීම.
උන්වහන්සේගේ කැමැත්තට ප්‍රතිචාර දැක්වීම.
ජේසුස්වහන්සේගේ අධිකාරී බලය පිළිබඳ විශ්වාසය. ආදී පිළිතුරු.
(ල. 2 + 3 + 5 = 10)

05. (1) දෙවියන් වහන්සේ හා මිනිසා අතර සන්නිවේදන මාධ්‍යයයි.
(2) ශ්‍රාවකයන් තේරීමට පෙර / පාළුකරයේ දී නිරාහාරව යාච්ඤා කිරීම / ගෙත්සමන උයනේදී දුක් ප්‍රාප්තියට පෙර / ප්‍රාතිහාර්ය කිරීමට පෙර
(3) ලියා ඇති පිළිතුරු අනුව ලකුණු දෙන්න.
(ල. 2 + 3 + 5 = 10)

06. (1) බර්ණබස් හා ජොහාන් නම් ලත් මාර්ක්
(2) * විජාතික කිතුණුවන් මූලිකව සිටි සභාවකි.
* දිවැසිවරු හා ගුරුවරු සේවයේ යෙදී සිටියා ය.
* බර්ණබස්, නිගර් නම් සිමියොන්, සිරේනියේ ලුසියස්, මානායින් සාවුල් සිටීම.
* සාගතය අවස්ථාවේ දී ජුදයේ සිටි සහෝදරයින්ට ආධාර යැවීම.
(3) * හවුල් නායකත්වය තුළ දේව ගෞරවය දෙවියන් වහන්සේට පමණක් ලබාදීම.
* තමා කිසි ගෞරවයක් අත්පත් කර නොගැනීම.
* නිහතමානීව හැසිරීම.
* වැරදි ක්‍රියාවන්ට එරෙහිව නැගී සිටීම.
* ඕනෑම පීඩන තත්ත්වයක් තුළ සුබසුන දේශනා කිරීමට පසුබට නොවීම.
* මරණීය තර්ජන ඉදිරියේ දී පවා ධෛර්යයෙන් යුතුව ක්‍රියා කළ බව තවදුරටත් සනාථ වීම.

07. (1) පරීක්ෂාවන් ජයගනිමු.
* පරීක්ෂා පැමිණියේ පාළුකරයේ දී
* ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂා තුනම ලියන්න.
* පරීක්ෂාවන්ට දේව වචනයෙන් පිළිතුරු දීම.
* ලියා ඇති පරීක්ෂා සලකන්න.
* පැමිණෙන පරීක්ෂාවන් දේව වචනය තුළින් සෙවීම.
(ල. 2 + 3 + 5 = 10)
(2) පෙරමඟ දූත සේවය
* ස්නාවක ජොහාන්
* පාළුකරයේ වාසය කරමින් යාච්ඤාවේ යෙදෙමින්
* ජේසුස් වහන්සේ වෙනුවෙන්
* ජනතාව මනස්ථාපනයට යොමු කිරීම
* ශුද්ධාත්ම මඟපෙන්වීම අනුව ක්‍රියා කිරීමට යොමුවීම
(3) මුල් කිතුණු සභාව
* ජේසුස් වහන්සේගේ උත්ථානයෙන් දින 50 කට පසු පෙන්තකොස්ත දින
* සැඩ සුළඟක් හමන්නාක් වැනි හඬක් අහසින් නික්මීම.
* ගිනි දළු වැනි දිවි බෙදී ගොස් එකිනෙකා මත පිහිටීම.
* සැවොම ශුද්ධාත්ම බලයෙන් පූර්ණව අන්‍ය භාෂාවලින් කතා කිරීම.
* නමස්කාරික ජීවිතය - ධර්මදූත සේවය
* සමානාත්මතාවය උසස් කොට සැලකීම.
(4) ගරු චන්ද්‍රා ප්‍රනාන්දු පියතුමා
* සාමය වෙනුවෙන් තම ජීවිතය පවා කැපකළ පියතුමෙකි.
* මඩකලපුවේ දී උපත ලැබීම, 1972 දී නිල පූජකවරය ලැබීම.
* පල්ලියේ ගොඩනැගිල්ල ජනතාව සඳහායි උදාර ආකල්පය.
* ''කිසිවෙක් තමාට ස්වාමියාණෝ කියා නොගන්න.'' නායකයා සේවකයා විය යුතු බව එතුමාගේ සේවයේ පදනමයි.
* අප ද සේවය අවශ්‍ය අයවලුන් සඳහා සේවය කිරීම.
(ල. 5 + 5 = 10)